# සිංහලයේ
# වචන වෙන් කිරීම

ශ්‍රී ලංකා සංස්කාරකවරුන්ගේ සංගමය විසින්
ප්‍රකාශයට පත් කරන ලදී.

# පූර්විකා

සිංහලයේ වචන වෙන් කිරීම පිළිබඳ ගැටලුව මතු වන්නේ ආධුනික ලේඛකයන්ට හා පාසැල් ශිෂ්‍යයන්ට පමණක් නොවේ. ප්‍රවීණ ලේඛකයන්, ග්‍රන්ථ සංස්කාරකයන් සහ ප්‍රකාශකයන් ඇතුළු කාහටත් එය ගැටලුවක් වන්නේ මෙහිලා තර්කානුකූල වූත්, පිළිගත හැකි වූත් සම්මතයක් නොමැති නිසාය.

ශ්‍රී ලංකා සංස්කාරකවරුන්ගේ සංගමය විසින් මේ ප්‍රශ්නය සිංහල සාහිත්‍ය විෂයෙහි ප්‍රවීණයන් කීපදෙනෙකු වෙත ඉදිරිපත් කරනු ලැබූ කල්හි ඒ හැමදෙනාගේම අදහස වූයේ මෙම සංගමය ඉදිරිපත් වන්නේ නම් සිංහලයේ වචන වෙන් කිරීම සම්බන්ධ-යෙන් යම් සම්මතයක් ඇති කරලීමට සහයෝගය දක්වන බවය. මීට පෙරාතුවද මේ සම්බන්ධයෙන් වරින්වර කටයුතු කෙරුණ නමුත් ඒ ප්‍රයත්න අසාර්ථක වූයේ සිංහල ලේඛනය සම්බන්ධයෙන් හැම මතවාදයක්ම, හැම ගුරුකුලයක්ම ඒ සම්මතයට පිවිසවීමට ගනු ලැබූ අසාර්ථක ප්‍රයත්න නිසා බව ප්‍රකට කරුණකි. සම්මතය නම් හැම දෙයක්ම පිළිගැනීම නොව හැකි තාක් දුර යම් එක් ක්‍රමයක් අනුගමනය කිරීමට එකඟ වීමය.

මේ සම්මතය ඇති කරගනු ලැබුවේ මතු සඳහන් භවතුන් කීප වතාවක් රැස් වී තර්කවිතර්ක ඉදිරිපත් කොට සාකච්ඡා කිරීමෙන් පසුවය.

මහාචාර්ය විමල් ජී. බලගල්ලේ මහතා
මහාචාර්ය ඒ. වී. සුරවීර මහතා
මහාචාර්ය ජේ. බී. දිසානායක මහතා
මහාචාර්ය කේ. එන්. ඕ. ධර්මදාස මහතා
මහාචාර්ය පී. බී. මීගස්කුඹුර මහතා
කේ. ජයතිලක මහතා
ආචාර්ය රත්න විජේතුංග මහතා
මහාචාර්ය ආරිය රාජකරුණා මහතා

ජී. එස්. බී. සේනානායක මහතා
ගුණසේන විතාන මහතා
මහාචාර්ය චන්ද්‍රසිරි පල්ලියගුරු මහතා
ආචාර්ය අශෝක ප්‍රේමරත්න මහතා
කුලසේන පොන්සේකා මහතා
රන්ජිත් ධර්මකීර්ති මහතා
කිත්සිරි නිමල් ශාන්ත මහතා
හෙන්රි සමරනායක මහතා

ඇතැම් ලේඛකයන් යම් සම්මතයකට එළඹීමට මැලි වන්නේ තමන් විසින් එතෙක් අනුගමනය කරනු ලැබූ රචනා ක්‍රම සදොස් බව ඒ සම්මතයෙන් ගම්‍ය වේද යන සැකය ඇතිවය. එය එසේ නොවන බව අවධාරණය කළමනාය. දැන් කාගේත් පහසුව සඳහා සම්මතයක් සම්පාදනය වී ඇත්තේය. සිංහල භාෂාසාහිත්‍යයේ අභිවෘද්ධිය තකා කළ යුතු වන්නෙ මින් මතුවට මේ සම්මතයෙහි පිහිටීමයි.

පූර්වෝක්ත ආරාධිත භවතුන්ට අමතරව මේ කාර්යේදී ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය දැක්වූ සහයෝගය බෙහෙවින් අගය කරනු වටී. මේ සම්මතය සම්පාදනය කිරීමට සහභාගි වූ විද්වත් පිරිසටත්, එය පිළිගනිමින් ඊට අත්සන් තැබූ භවතුන්ටත් ශ්‍රී ලංකා සංස්කාරකවරුන්ගේ සංගමයේ කෘතඥතාව හිමි වන්නේය.

මේ ලේඛනයට අත්සන් තබා ඇත්තේ 1991.07.12 දින පැවති සාකච්ඡා වාරයට සහභාගි වී එය අනුමත කළ භවතුන් කිහිප දෙනා පමණක් වුවත් තව විශාල පිරිසක් මීට අනුකූලතා දක්වන බව සඳහන් කරනු කැමැත්තෙමු.

මහාචාර්ය ඒ. වී. සුරවීර

1991. 09. 10
ශ්‍රී ලංකා සංස්කාරකවරුන්ගේ සංගමය
41, ඩබ්ලියු. ඒ. ඩී රාමනායක මාවත
කොළඹ 2.

# සිංහලයේ වචන වෙන් කිරීම

සමාජයේ වෙනස් වීමත් සමඟ භාෂාවද වෙනස් වේ. මේ අනුව සිංහලයේ ලේඛන සම්ප්‍රදාය හා ව්‍යාකරණ රීති ආදියද වෙනස් වන බව කැමැත්තෙන් හෝ අකැමැත්තෙන්හෝ පිළිගැනීමට සිදු වන්නේය. මේ වෙනස් වීම භාෂාව භාවිත කරන ජනයාගේ පහසුව මෙන්ම අවශ්‍යතාද මුල් කර ගෙන සිද්ධ වන්නක් බැවින් වර්තමාන ලේඛන කටයුතුවලදී අතීත ව්‍යවහාර හා ව්‍යාකරණ රීති ආදිය කෙරෙහි පමණ ඉක්මවා එල්බ සිටීම අවශ්‍ය නොවන බව පෙනේ.

**නාම, ක්‍රියා, නිපාත** යනුවෙන් පද තුන් වර්ගයක් සිංහලයේ ඇති බව සැලකෙන නිසා ඒ එක් එක් පදය වෙන් කර ලිවීමට ඇතැම් අය පෙලඹෙතත් ඒ මඟින් ගැටලු මතු වන අවස්ථාද ඇත. පද බෙදීම යන ව්‍යවහාරය පවා ඇතැම් විට ලේඛකයා අවුලට පත් කිරීමට හේතු විය හැකිය. එබැවින්, 'පද බෙදීම' යන සාම්ප්‍රදායික යෙදුම වෙනුවට සිංහලයේ වචන වෙන් කිරීම යන්න මෙහිදී භාවිත කරනු ලැබේ.

## සිංහලයේ වචන වෙන් කිරීම පිළිබඳ සම්මතය

### 1. ප්‍රකෘති හා විභක්ති

(අ) -ගේ, -ගෙන්, -හට, -ට යන විභක්ති ප්‍රත්‍යය පෙර පදය සමඟ එක් කොට ලිවීම.

උදා :— ඔහුගේ, මිනිසාගේ
ඔවුන්ගෙන්, ගැහැනුන්ගෙන්
පුරුෂයාහට, මිනිසාහට
පුරුෂයාට, මිනිසාට.

(ආ) කථා ව්‍යවහාරයේදී යෙදෙන -ව (අනුක්ත), -ලා (බහු වචන) විභක්ති ප්‍රත්‍යය පෙර පදය සමඟ එක් කොට ලිවීම.

උදා :— මාව, ළමයාව
අම්මලා, තාත්තලා.

(ඇ) -වල් ප්‍රත්‍යය පෙර පදය සමඟ එක් කොට ලිවීම.

උදා :— නගරවල, නගරවලට, නගරවලින්
රටවල්, රටවල, රටවලට, රටවලින්
ලන්ඩන්වල, ලන්ඩන්වලට, ලන්ඩන්වලින්.

(ඈ) විසින්, කරා, කෙරෙන්, කෙරෙහි, වෙත, වෙතින් ආදි විභක්ති සූචක රූප පෙර පදයෙන් වෙන් කොට ලිවීම.

උදා : - අප විසින්, මා කරා, කාන්තාවන් කෙරෙන්,
මිනිසා කෙරෙහි,
දරුවා වෙත, දෙමාපියන් වෙතින්.

එහෙත්

'මා' යන සර්වනාම පදය විභක්ති සූචකයකට පෙර 'ම' යනුවෙන් කෙටි වන කල්හි අපර පදය සමඟ එක් කොට ලිවිය යුතුය.

උදා :— මවිසින්, මවෙත.

(ඉ) සම්බන්ධාධාර අර්ථයෙහි හා කාලාර්ථයෙහි යෙදෙන -දී -ලා යන රූප පෙර පදය සමඟ එක් කොට ලිවීම.

උදා : — එකේදී, කරද්දී, ගෙදරදී,
බැංකොක්හිදී, ලන්ඩන්වලදී,
රැස්වීම්වලදී, ව්‍යවහාරයේදී,
1956දී, 1991දී,
ක්‍රීඩාවෙහිලා, මෙහිලා, සාහිත්‍යයෙහිලා.

(ඊ) කරණ විභක්ති සූචක 'කරණකොටගෙන' යන්න තනි වචනයක් සේ ලිවීම.

## 2. සන්ධි

පද දෙකක් හෝ කිහිපයක් සන්ධි වන කල ඒ හැම එක් කොට ලිවීම

උද :— අද්දැකීම (අත් - දැකීම)
උපමාලංකාරය (උපමා - අලංකාරය)
ඔවුනොවුන් (ඔවුන් – ඔවුන්)
කලායතනය (කලා – ආයතනය)
ගමනාගමන (ගමන – ආගමන)
නයනාරෝග්‍ය (නයන – ආරෝග්‍ය)
නිලුපුලැසි (නිල් – උපුල් – ඇසි)
බුත්සරණ (බුදු – සරණ)
යන්ත්‍රෝපකරණ (යන්ත්‍ර - උපකරණ)

## 3. සමාස

(අ) පද දෙකක් හෝ කිහිපයක් සමාස වන කල ඒ හැම එක් කොට ලිවීම

උද :— අත්පොත, අත්වැඩ, ඇස්ඉස්මස්ලේ, උණුදියබඳුන, කළුසුද්දා, කිරිඅම්මා, කිරිබත්, කෙටිකතාව, තුනපහ, දසසිල්, දූරකථනය, නරදෙව්, නැගෙනහිර, පෙරවදන, පොත්ගුල බඹදත්, බිම්බෝම්බය, මල්හිනාව, මහතෙර, මැටිබඳුන, රජපිරිස්, විශ්වවිද්‍යාලය, ශිලාලේඛන සතුරුබල, සොරබිය, හොඳහිත.

(ආ) රකාරාංශයක් සහිත අකුරකින් ආරම්භ වන පදයකට පූර්වයෙන් සංස්කෘත පදයක් යෙදීමෙන් සෑදෙන සමාසය එක් කොට ලිවීම

උද :— අභාවප්‍රාප්ත, කාලක්‍රියා, ග්‍රන්ථප්‍රකාශකයා, ජනප්‍රිය, ධර්මප්‍රදීපිකාව, නීතිප්‍රකාර,

ප්‍රයෝජ්‍යක්‍රියාව, මිලින්දප්‍රශ්නය, මූලද්‍රව්‍ය, ලෝකප්‍රවෘත්ති, සූර්යග්‍රහණය.

(ඇ) විශේෂණ සමාස වශයෙන් සැලකෙන වචනවල විශේෂ-ණය හා විශේෂ්‍යය එක් කොට හෝ වෙන් කොට ලිවීම

උදා :— රතුමල ; රතු මල
උණුවතුර ; උණු වතුර
නිල්මානෙල් ; නිල් මානෙල්.

(ඈ) සමාසය අතිශයින් දීර්ඝ වන කල්හි එය සුදුසු පරිදි වෙන් කොට ලිවීම

උදා :— තිලෝගුරු බුදුරජාණන් වහන්සේ.

## 4. ලිංග

ලිංගාර්ථ සූචක -දෙන, -රාල ආදි රූප එක් කොට ලිවීම

උදා :— එළදෙන, කොටිදෙන,
ගමරාල, නැකැත්රාල, වෙදරාල,
නෝනාමහත්මයා, වෙදමහත්මයා,
නයිහාමි, රාලහාමි, වෙදහාමිනේ,
සිංහධේනුව,
රජබිසව.

## 5. සංඥානාම

(අ) මහතා, මහත්මයා, මහත්මිය, මෙණෙවිය, රාලහාමි, අප්පුහාමි ආදිය පුද්ගලනාම සමඟ යෙදෙන විට වෙන් කොට ලිවීම

උදා :— ගුණතිලක මහත්මයා, පෙරේරා මහත්මිය, ගුණවතී මෙණෙවිය, කිරිබණ්ඩා රාලහාමි, සීමොන් අප්පුහාමි.

(ආ) පද කීපයක් එක් වී සෑදෙන සංඥානාම එක් කොට ලිවීම

උදා :— ඇබේගුණවර්ධන, කිරිබත්ගොඩ,
ගලෙන්බිඳුණුවැව, නුවරඑළිය,
පොල්ගහවෙල.

## 6. සර්වනාම

(අ) තෙම, තොමෙ, තොමෝ, තුමූ යන පද පෙර පදයෙන් වෙන් කොට ලිවීම

උද :— හේ තෙමේ, ඕ තොමෝ, මෝ තොමෝ
සහා තොමෝ, මූ තුමූ.

(ආ) සර්වනාමය ඊට පරව යෙදෙන පදයක් සමඟ සංයෝග වන කල එක් කොට ලිවීම

උද :— ඊළඟ, එතෙම, එද, එනමුත්, එබැවින්,
එලෙස, එසේ,එහෙත්,එහෙයින්,කෙතෙක්,
කෙබඳු, කෙලෙස, කෙවත්, කෙසේ,
කොපමණ, මීළඟ, හෙතෙම.

(ඇ) සර්වනාම දෙකක් සම්බන්ධ වී ඒකකාර්ථයක් කියවෙන කල්හි ඒ වචන එක් කොට ලිවීම

උද :—අන්කිසි, කිසියම්, මොනයම්, යම්කිසි,
යම්කිසිවෙක්, වෙනයම්.

## 7. ගෞරවාර්ථ සූචක රූප

(අ) තුමා, –තුමී, –වර ආදි රූප පෙර පදය සමඟ එක් කොට ලිවීම

උද :— අධ්‍යක්ෂතුමා, ඇදුරුතුමා,
ධර්මපාලතුමා, රජතුමා,
ගුරුතුමී, සභාපතිතුමිය,
ගුරුවරයා, නගරාධිපතිවරිය.

(ආ) දෑ, වහන්දෑ, වහන්සේ යන පද සන්ධි නොවූ හෝ සමාස නොවූ හෝ පදයකට පරව යෙදෙන විට පෙර පදය සමඟ එක් කොට ලිවීම

උද :— උන්දෑ, හෙරණුන්දෑ, බිසවුන්දෑ,
උන්වහන්සේ, බිසවුන්වහන්සේ,
ස්වාමීන්වහන්සේ.

(ඇ) වහන්දෑ, වහන්සේ යන පද සන්ධි වූ හෝ සමාස වූ හෝ පදයකට පරව යෙදෙන විට වෙන් කොට ලිවීම

උද :— බුදුරජාණන් වහන්සේ,
විහාරාධිපතීන් වහන්සේ,
ස්ථවිරපාදයාණන් වහන්සේ.

## 8. සංඛ්‍යාවාචි වචන

(අ) වන, වැනි වෙනි ආදි රූප පෙර පදය සමඟ එක් කොට ලිවීම

උද :— පළමුවන, පළමුවැන්නා, පළමුවෙනියා,
දෙවන, දෙවැන්නා, දෙවෙනියා,
දොළොස්වැන්නා, පසළොස්වෙනියා,
අනූනවවැන්නා.

(ආ) දෙන, දෙනා, යන රූප පෙර පදය සමඟ එක් කොට ලිවීම

උද :— අසූහතරදෙනෙකුට, කීපදෙනෙක්, ටික-
දෙනෙකු,
තිදෙනා, තුන්හතරදෙනා, දෙදෙන,
පස්දෙනා, බොහෝදෙනා, සැමදෙන,
සියලුදෙනා, සිවුදෙනා, ස්වල්පදෙනෙක්.

(ඇ) ඉහත (අ), (ආ) යටතේ දැක්වෙන පදවල සංඛ්‍යා ඉලක්කමෙන් යොදනු ලබන කල්හි ඊට පරව එන විභක්ති රූපය ඒ සංඛ්‍යාව හා එක් කොට ලිවීම

උද :— 2කින්, 51කට, 8වැන්නා, 11වන, 12ක්,
94දෙනෙක්, 1991දී.

(ඈ) සංඛ්‍යාවාචී යුගළ වචන එක් කොට ලිවීම

උද :—අසූඅනූ, තුන්හතරදෙනෙක්, දෙතුන්සියයක්,
දෙතුන්දෙනා.

(ඉ) සංඛ්‍යාවාචී පදයක් මුල් වී සෑදෙන සමාස තනි වචනයක් සේ සැලකීම

උදා :— අටපට්ටම, අටමහල, තුන්සරණ, දෙමුහුන, නවගුණ, පන්සිල්, විසිවැදෑරුම්, සතරඅපා, සතරදිසා, සතරවරම, සිවුකොන්.

(ඊ) සංඛ්‍යාවාචී පද කීපයක් වෙන් වශයෙන් විභක්ති ගන්නා කල්හි ඒ වචන වෙන් කොට ලිවීම.

උදා:— අසූවක් අනූවක්, සීයක් හමාරක්,
දහසකට දෙදහසකට, දහසකගේ දෙදහසකගේ.

(උ) සංඛ්‍යාවාචී වචන කීපයක් එකට යෙදී තනි වචනයක් වශයෙන් දිග වැඩි බව පෙනෙන කල්හි වචන දෙක බැගින් වෙන් කර ලිවීම

උදා :— දෙදහස් පන්සිය අනූහතරයි.
හැත්තෑදහස් නවසිය අසූඅටදෙනෙක්.

## 9. තද්ධිත

(අ) කම, –තා, –බව, –භාව යන භාවවාචී තද්ධිත, විශේෂණ– පද සමඟ යෙදෙන විට එක් කොට ලිවීම

උදා :— දක්ෂකම, දුප්පත්කම, නපුරුකම,
දරිද්‍රතාව, නිශ්ශබ්දතාව, විශේෂතාව,
කරුණාවන්තබව, ගරුසරුබව, නපුරුබව,
කරුණාවන්තභාවය, ත්‍යාගශීලිභාවය.

(ආ) 'බව' යන පදය කෘදන්තයකට පරව යෙදෙන කල්හි වෙන් කොට ලිවීම

උදා :— කරන බව, කළ බව, සිතුණ බව, සිතූ බව, සිතෙන බව.

(ඇ) නාමපද සහ විශේෂණපද සාධනයෙහි යෙදෙන තද්ධිත– ප්‍රත්‍යය පෙර පදය සමඟ එක් කොට ලිවීම

| | | |
|---|---|---|
| –කර | : | හිතකර, අනර්ථකර |
| –කරු | : | ගත්කරු, විනිසකරු |
| –කලු | : | කන්කලු, සිත්කලු |
| –කාමී | : | කලාකාමී, සාමකාමී |

-කාර : කවිකොළකාරයා, කිරිකාරයා

-කාරී : රතුහැට්ටකාරී, ආඩම්බරකාරී

-කාරි : පීඩාකාරි, විනාශකාරි

-ගත : වේදිකාගත, සභාගත

-ගරුක : ගුණගරුක, සත්‍යගරුක

-ගාමී : ආකාශගාමී, ශීඝ්‍රගාමී

-ගුලු : බියගුලු

-ජනක : ත්‍රාසජනක, හාස්‍යජනක

-තම : පැරණිතම, ශ්‍රේෂ්ඨතම

-තර : උත්තරිතර, වෘද්ධතර

-තුමා : අධ්‍යක්ෂතුමා, මන්ත්‍රීතුමා

-තුමී : ගුරුතුමී, මවුතුමී

-දයක : ගුණදයක, සුවදයක

-ධර : විනයධර, සාහිත්‍යධර

-ධාරි : උපාධිධාරි, සූත්‍රධාරි

-පත් : බියපත්, යහපත්

-පතා : දිනපතා, මාස්පතා

-පූර්වක : කෘතඥතාපූර්වක, ස්තුතිපූර්වක

-බද : ගම්බද, නගරබද

-බර : පෙම්බර, සෝබර

-මත් : බුද්ධිමත්, රූමත්

-මය : රජතමය, ස්වර්ණමය

-මුවා : රන්මුවා, රිදීමුවා

-වත් : ගුණවත්, සිල්වත්

-වන්ත : කරුණාවන්ත, භාග්‍යවන්ත

-වර : ගුරුවරයා, පඬිවරයා

-වාදය : අලංකාරවාදය, සමාජවාදය

-වාදී : යථාර්ථවාදී, සමාජවාදී

-ශීලි : ත්‍යාගශීලි, සමාජශීලි

-සහගත : මෛත්‍රීසහගත, ද්වේෂසහගත

## 10. කෘදන්ත

කෘදන්ත රූපයක් සමඟ යෙදෙන පූර්ව, විරි, විරූ, මනා, සුලු යන වචන පෙර පදය සමඟ එක් කොට ලිවීම

උදා :— අභූතපූර්ව, අදෘෂ්ටපූර්ව, නුදුටුවිරූ, නොකළවිරි, නොඇසුවිරූ, කළමනා, සිතුවමනා, කැඩෙනසුලු, පුපුරනසුලු.

## 11. උපසර්ග

(අ) උපසර්ගය පසු පදය සමඟ එක් කොට ලිවීම

උදා :— අනුමණ්ඩලය. අතිමහත්, අවනම්බුව, අවශේෂ, උපඇමති, උපවිදුහල්පති, දුර්විපාක, පිළිගැනීම, පුනර්ජීවනය, ප්‍රතිසංවිධානය.

(ආ) ස්ව–, ස්වයං– යන රූප පසු පදය සමඟ එක් කොට ලිවීම

උදා :— ස්වදේශීය, ස්වභාවය, ස්වයංක්‍රිය, ස්වයංපෝෂණය, ස්වයංලිඛිත.

## 12. නිපාත

(අ) තනිව යෙදී අර්ථයක් ප්‍රකාශ කරන නිපාත තනි පද සේ ලිවීම

උදා :— එහෙත්, කරා, තරම්, තාක්, තුරු, තෙක්, දක්වා, පවා, පාසා, පාහේ, බඳු, මිස, මුත්, මෙන්, වඩා, වනාහි, වන්, වාගේ, වැනි, විනා, සහ, සෙයින්, සේ, හා, හෙවත්.

(ආ) '–හොත්' නිපාතය පෙර පදය සමඟ එක් කොට ලිවීම

උද :— කරතහොත්, කළහොත්, කියතහොත්,
ගියහොත්, නොහොත්, බලතොත්, යතොත්

(ඇ) 'නො' නිපාතය පසු පදය සමඟ එක් කොට ලිවීම

උද :— නොකරන්නේය, නොකළ, නොගොස්;
නොපනත්, නොපිළිගනී, නොමනා, නොමිනිස්,
නොයයි, නොවන, නොවූ, නොහැකි, නොහොඳ.

(ඈ) 'ම' නිපාතය පෙර පදය හා එක් කොට ලිවීම

උද : — අදම, අවස්ථාවේදීම, එකම, එසේම, කරත්ම,
කොළඹටම, නගරයෙහිම, බලවත්ම,
බොහෝම, මිනිසාගේම, ලොකුම.

(ඉ) (i) සමුච්චයාර්ථයේ සහ ප්‍රශ්නාර්ථයේ 'ද', 'දෝ' යන නිපාත පෙර පදය සමඟ එක් කොට ලිවීම

උද :— අඹද පොල්ද, ඔහුද මමද,
අපහසුද? එත්ද? යනවාද?
කවදදෝ, ගියේදෝ.

(ii) 'ද' නිපාතය පෙර පදය සමඟ සන්ධි වී '–ත්' යනුවෙන් යෙදෙන කල එක් කොටම ලිවීම

උද :— අම්මාත් තාත්තාත්, ඇයත් ඔහුත්,
කිරිත් පැණිත්.

(iii) ඉහත (i) ට සමාන 'දැයි' යෙදෙන තන්හිද පෙර පදය සමඟ එක් කොට ලිවීම

උද :— මට බඩගිනිදැයි අම්මා ඇසුවාය.
.... මම්ම වේදැයි වදළසේක.

(ඊ) වාක්‍යාවසානයේ ය, යි, හ, සේක, දැය යන නිපාත පෙර පදය සමඟ එක් කොට ලිවීම

උද :— කළාහුය, ගියේය, යන්නේය, යන්නෝය,
පමණයි, බඩගිනියි, හොඳයි,
කළාහ, ගියහ, බැලූහ, සිටියහ,
දන්වූසේක, වදළසේක,
ගියදැය, වදළදැය.

(ඌ) උද්ධෘතපාඨ සහිත යෙදුම්වලදී යි, යයි, යැයි නිපාත වෙන් කර ලිවීම

උදා :— ''මිනිසා ගෙදර'' යි ඔහු කීවේය.
''බොරු නොකියනු'' යයි ගුරුතුමා පැවසුවේය.

(ඌඉ) උද්ධෘත රහිතව අන්තර්වාක්‍යයකට පසුව 'යි' යෙදෙන කල්හි එය පෙර පදය සමඟ එක් කොට ලිවීම.

උදා :— කළහයි, ගියේයයි, බැලූහයි, වශයෙනැයි.

## 13. ආඛ්‍යාත

(අ) 'ව' වීමේ ධාතුව හා සම්බන්ධ වචන

(i) සංවෘතව කියවෙන කෘදන්ත 'ව' කාරය පෙර පදය සමඟ එක් කොට ලිවීම

උදා :—අනුව, ගුරුවරයෙකුව,නොවෙනස්ව, පැහැදිලිව. පිළිබඳව, මහත්ව, වෙන්ව, සතුටුව.

(ii) වන, වන්නේය, වී, වුණු, වූ, වූයේය, වූහ, වීම ආදී අනික් සෑම තන්හිදීම වෙන් කොට ලිවීම

උදා :— සංවර්ධනය වන, නිදහස් වන්නෙය,
ප්‍රමාද වී, අමතක වුණා, ආරම්භ වූ,
අභාවප්‍රාප්ත වූයේය, ව්‍යාප්ත වීම.

(iii) 'වීම' යනු සමාසයක අපර පදය ලෙස යෙදෙන කල්හි එය පෙර පදය සමඟ එක් කොට ලිවීම

උදා :— පත්වීම (නිද : ගුරු පත්වීම් 500ක්.....)
සිදුවීම (නිද : මෙබඳු සිදුවීමක් මින් පෙර....)

(iv) ප්‍රයෝජ්‍ය 'ව' ප්‍රත්‍යය සහිත ධාතුවලින් සෑදෙන පද තනි වචන සේ ලිවීම

උදා :— කරව : කරවන,කරවයි, කරවා,
කරවීම, කරවූ,
දක්වා : දක්වයි, දක්වා, දැක්වීම,
දැක්වුණු, දැක්වූ, දැක්වෙයි,

පෙන්ව : පෙන්වන, පෙන්වයි,
පෙන්වා, පෙන්වීම, පෙන්වූ,

මෙහෙයව : මෙහෙයවන, මෙහෙයවයි,
මෙහෙයවා, මෙහෙයවීම,
මෙහෙයවූ,

වළක්ව : වළක්වන, වළක්වයි,
වළක්වා, වැළැක්වීම,
වැළැක්වූ.

හඳුන්ව : හඳුන්වන, හඳුන්වයි,
හඳුන්වා, හැඳින්වීම,
හැඳින්වූ.

(ආ) 'කර' කිරීමේ ධාතුව සමඟ සම්බන්ධ වන වචන වෙන් කොට ලිවීම

උදා :— ගමන් කරනවා, ගමන් කොට, පිරිසිදු කරවීම, වෙනස් කළ, වෙන් කර, සිදු කෙළේය.

එහෙත්

(i) 'කරුණාකර' යන්න තනි වචනයක් සේ ලිවිය යුතුය.

(ii) '–කරණය' යන්න වෙනත් පදයක් සමඟ එකට යෙදී ඒකකාර්ථයක් දෙන කල්හි තනි වචනයක් සේ ලිවිය යුතුය.

උදා :— කළමණාකරණය, ග්‍රන්ථකරණය, නාගරීකරණය, සාහිත්‍යකරණය.

(ඇ) 'ලබ' ලැබීමේ ධාතුව සහිත වචන වෙන් කොට ලිවීම

උදා :— කරනු ලබයි, කරනු ලැබේ, පසසනු ලැබීම පින් ලැබීම, මුදල් ලැබිණ, යවන ලදී.

(ඈ) 'ගන්' ගැනීමේ ධාතුව සමඟ යෙදෙන වචන

(i) 'ගන්' ධාතුව ගැනීමේ අර්ථයෙන් යෙදෙන කල්හි වෙන් කොට ලිවීම

උද :— පොත් ගත්තා, මුදල් ගත්තේය, වාහනයක් ගැනීම.

(ii) 'ගන්' ධාතුව උපකාරක ක්‍රියාවක් වශයෙන් යෙදෙන විට පෙර පදයට එක් කොට ලිවීම

උද :— ඉඳගත්තා, උකහාගැනීම, දැනගන්නවා, නාගන්නවා, නිදගන්නවා, බලාගන්නවා.

## 14. මිශ්‍ර ක්‍රියා

මිශ්‍රක්‍රියා අර්ථයෙහි යෙදෙන ද්විත්ව ක්‍රියා රූප එකට ලිවීම

උද :— අඹරඅඹරා, ඇදඇද, කකා, කවකවා, කියකියා, නටවනටවා, පෙන්වපෙන්වා, පොවපොවා.

## 15. ප්‍රතිධ්වනි සමාස සහ යුගළ වචන

ප්‍රතිධ්වනි සමාස සහ යුගළ වචන වෙන් කොට ලිවීම

උද :— අඩු පාඩු, අඩුම කුඩුම, අඩා දොඩා, අඬු බඩු,
අත්තා මුත්තා, අහන බලන,
ඇයි හොඳයි, ඇසූ දුටු, ඇහුම් බැලුම්,
උයන පිහන, ඔප්පු තිරප්පු,
කයි කතන්දර, කවන පොවන, කැපූ කෙටූ,
කුල මල, කුලී මලී, ගරු සරු,
තාන්න මාන්න, දුවන පනින, දුව පැන,
බලා කියා, බහින් බස්,
ලට්ට ලොට්ට, සිතා මතා, සිතූ පැතූ.

✶

## මෙම සම්මතය සඳහා අත්සන් තැබූ භවතුන්ගේ නාම ලේඛනය

මහාචාර්ය ඒ. වී. සුරවීර

මහාචාර්ය විමල් ජී. බලගල්ලෙ

මහාචාර්ය පී. බී. මීගස්කුඹුර

මහාචාර්ය කේ. එන්. ඕ. ධර්මදස

මහාචාර්ය ජේ. බී. දිසානායක

මහාචාර්ය මැන්දිස් රෝහණදීර

මහාචාර්ය ආරිය රාජකරුණා

ජී. එස්. බී. සේනානායක මහතා

කේ. ජයතිලක මහතා

මොනිකා රුවන්පතිරණ මහත්මිය

එච්. එම්. මොරටුවගම මහතා

සරත් විජේසූරිය මහතා

ගුණසේන විතාන මහතා

බොබී ජී. බොතේජු මහතා

ආචාර්ය පියසීලි විජේමාන්න මහත්මිය

සුමන දිසානායක මහතා

නිමල් ආරියවංශ පෙරේරා මහතා

ආරියදාස වීරමන් මහතා

මහාචාර්ය චන්ද්‍රසිරි පල්ලියගුරු

ජයන්ත විමලසේන මහතා

ආචාර්ය රත්න විජේතුංග

ඇස්. ගොඩගේ මහතා

මුදියන්සේ දිසානායක මහතා

උපාලි අමරසිරි මහතා

කේ. බී. ඒ. එඩ්මන්ඩ් මහතා

ලක්ෂ්මන් කහටපිටිය මහතා

ලීල් ගුණසේකර මහතා

කිත්සිරි කාරියප්පෙරුම මහතා

හෙන්රි සමරනායක මහතා

ඊශ්වරී කොරයා මහත්මිය

අධිනීතිඥ ඩබ්ලිව්. ඒ. අබේසිංහ මහතා

මහාචාර්ය සුනිල ආරියරත්න

ගුණදස අමරසේකර මහතා

ප්‍රණීත් අභයසුන්දර මහතා

ඇස්. ජී. සමරසිංහ මහතා

ඩී. එස්. මෙත්තානන්ද මහතා

ආචාර්ය උදය මල්ලවාරච්චි

ආචාර්ය අශෝක ප්‍රේමරත්න

## ශ්‍රී ලංකා සංස්කාරකවරුන්ගේ සංගමය

### නිලධාරි මණ්ඩලය

සභාපති : මහාචාර්ය ඒ. වී. සුරවීර

ලේකම්/භාණ්ඩාගාරික : හෙන්රි සමරනායක

විධායක සභාව : කේ. ජයතිලක

ගුණසේන විතාන

ආචාර්ය උදය මල්ලවාරච්චි

ඇස්. ජී. සමරසිංහ

ජයන්ත අල්විස්

ගමගේ සුමනසේකර

ඩී. ඇස්. මෙත්තානන්ද

පියවති ජයසූරිය

එච්. ඇන්. පීරිස්



